අධ්‍යාපන අමාත්‍යාංශය

ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

සිංහල භාෂා ඒකකය

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය 2023**

**කලාප මට්ටම**

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................................

(මුලකුරු සමඟ නිවැරැදිව ලියන්න )

02. විදුහලේ නම සහ ලිපිනය : .........................................................................................................

03. පාසල් වරගය : 200 තෙක් / 201-500 තෙක් / 500ට වැඩි

04. කලාපය : ..........................................................................................................

05. පළාත : ..........................................................................................................

---

**සාහිත්‍ය දැනුම මිනුම**

6 ශ්‍රේණිය කාලය පැය 02යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. පෙළ පොතින් දැනුම ඇසුරෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| | ප්‍රකාශය | ප්‍රකාශය ඇතුළත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක්ද | කාහට කියන ලද්දක් ද |
|---|---|---|---|---|
| i | “ දුකට පත් උණ වෙලාවක පිහිටක් ඉල්ලන යාළුවෙකුට හිනාවීම ඒතරම් වැදගත් කාරියක් නොවේ.” | | | |
| ii | “ කිමෙක්ද? දරුවෙනි, පැන් නොබෙව් දැ ”යි කිවුය. | | | |

| | | | | |
|---|---|---|---|---|
| iii | "ගහට ටිකක් නැගලා බැලුවට වරදක් වෙන්නේ නෑ " | | | |
| iv | " මෙච්චර හොඳ වතුර මම කවදාවත් දැක්කේ නැහැ" | | | |
| v | " වැඩක් කරගන්න උදවුවට ගන්න, කෙනෙක් අරගන්න තමයි මම ඉන්නේ" | | | |

( ලකුණු 3*5 = 15)

02. පෙළ පොතෙන් උපුටාගෙන ඇති පහත සඳහන් පද්‍ය සම්පූර්ණ කරන්න.

i. ඉර උදා වන්නට

පළමුව නැගිට සිහිකොට

.............................................

.............................................

ii. සසඳ සසඳ අපි හඳපානේ යනවා

....................................................................

සත්සිය සගවුවට රෝදේ කැරකෙනවා

........................................................................

iii. කඳ කුමරිඳු ලෙසි න

බමුණු පැටියන් සමඟි න

......................................................

.........................................................

iv. ............................................................

..............................................................

පුංචි පුංචි නුවණිනා

පුංචි ළමෝ පඩි වෙනා

v. වනේ ගිජිදාය දුටුවොත් වනසාය

.........................................................................

.........................................................................

මරණ තුනක් ඇති මිනිසෙක් පැණිකැය

(ලකුණු 2*5 = 10 )

03. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

i. ප්‍රබන්ධෝපදේශයේ කතුවරයා වන්නේ ,

1.මාටරීන් වික්‍රමසිංහ ii. ඒ.පි. ගුණරත්න

Iii. මුනිදාස කුමාරතුංග iv. හේමපාල මුනිදාස

ii. පන්සියපනස් ජාතක පොතේ සඳහන් කතා සංඛ්‍යාව

i. 550 ii. 547

ii. 505 iv. 517

iii. " සිරිත් මල්දම" කෘතිය,

i ජනකවි සාහිත්‍යයකි ii උපදේශ සාහිත්‍යකි

iii . ගද්‍ය සාහිත්‍යයකි iv ජනනාටක සාහිත්‍යයකි

iv. ඒ.පී.ගුණරත්න මහතා පරිවතර්නය කළ මැකී ගිය දඩයම කෘතියේ මුල් කෘතියෙහි කතුවරයා

i බටෙර්ල් බ්‍රෙෂ්ට් ii රොබට් නොක්ස්

iii කැප්ටන් ප්‍රෙඩ්රික් iv ආර්. එල්.ස්පිට්ල්

v. අලි උවදුර කතාව අඩංගු මුල් කෘතිය

i කියවන නුවණ ii හත්පණ

iii හීන්සැරය iv මඟුල් කෑම

(ලකුණු 2*5=10)

04. පහත දැක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බන්දා විජය දද අකනිට පද හිමිවේ
සින්දා හළ එකෙත් රිපු සිරිලක් අම්මේ
අන්දා ඔබගේ සිතියම හදමිණි බැම්මේ
වැන්දා මෙන්න මුදුනත් නගමින් දැම්මේ

කරුණා මහිම කොයි තරමද කිවොත් ඔබේ
මැවුණා මහා ගංභාවල් ලෙසින් ඉබේ
ඉනුණා බසින දියරක් තැවරුණොත් මොබේ
මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ

i. මෙම පද්‍ය වලින් කියවෙන්නේ කුමක් ගැන ද?
ii. මෙම පද්‍යවල ඇති උපමාවක් ලියන්න.
iii. පද්‍යයට අනුව දිය දහරා ගලා බසින්නේ කුමක් ලෙසින් ද?
iv. මරණාසන්න වුවකුට ජීවිතය ලැබෙන්නේ කුමකින් ද?
v. " ආසි ලැබේ" යන්නෙහි අර්ථය ලියන්න.

(ලකුණු 2*5 = 10 )

05. පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුවේ යොදන්න.

i. මඟ දිගට ජනකතා කෘතියේ කතුවරයා මාටරීන් වික්‍රමසිංහ මහතාය. ☐
ii. පුංචි පැළේ ගස වෙනා කෘතිය ස්වයංචරිතාපදානයකැයි කිව හැකිය. ☐
iii. ගුත්තිල කාව්‍යය වැත්තෑවේ හිමියන් රචනා කරන ලද්දකි. ☐
iv. පන්සිය පනස් ජාතක පොතේ එන කුස ජාතකය පාදක කරගෙන කාව්‍යශේඛරය රචනා කර ඇත. ☐
v. වානර සමූහයාගේ ජීවිත දියරකුසාගෙන් බේරාගත් වඳුරු රජතුමා හමුවන්නේ නලපාන ජාතකයේය. ☐

(ලකුණු 1*5 = 5 )

06. පහත දැක්වෙන පද වල අර්ථය ලියන්න

i. රාජද්‍රෝහී -

ii. පණිදා -

iii. රඹතුරු -

iv. සියලඟ

v. ධවල

vi. පුෂ්කරණීහු

vii. ගිජිඳා -

viii. පුන්කුඹු -

ix. රන්දද -

x. සහපිරිවරින් -

(ලකුණු 1*10 = 10 )

07. පහත දැක්වෙන වාක්‍යවල උපමාව හා උපමේය වෙන්කර ලියන්න

i. මල් කැකුළු වැනි දරුවන් ආරක්ෂා කළ යුතුය.

ii. සීයාගේ රැවුල පුලුන් ගොඩක් වැනිය.

iii. රත් ව ගිය යවට වැනි ඇස්.

iv. මාගේ ස්වාමිදරුවන්ගේ මධුරනාද නැමැති හස්ති කාන්ත වීණානාදය.

v. ඇගේ මුහුණ සඳ වැනිය.

| උපමාව | උපමේය |
|---|---|
| I | |
| Ii | |
| Iii | |
| Iv | |
| V | |

(ලකුණු 2*5 = 10)

08. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. "හවඩියා" නැමැති මුරකරු සේවය කළේ කුමන රජු යටතේ ද?

.........................................................................

ii. පුංචි පැළේ ගසවෙනා කෘතියේ කතුවරයා නම් කරන්න.

..............................................................................................

iii. "එදාහෙළදිව" කෘතියේ කතුවරයා කවුද? ..................................................................................

iv. "ඇවිදින කොළය" පාඩම ඇතුළත් කෘතිය සඳහන් කරන්න.

...............................................................................

v. කලාවැවට අධිගෘහිත දෙවියන් ලෙස සැලකූ පුද්ගලයා කවු ද?

..............................................................................

vi. නරිබෑනා නාට්‍යයේ රචකයා කවු ද? .....................................................................................

vii. පන්සියපනස් ජාතක පොත ලියූ සාහිත්‍ය යුගය සඳහන් කරන්න.

.......................................................................................

viii. සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට මඟ පෙන්වන උපදේශ සාහිත්‍ය කෘතියක් නම් කරන්න.

......................................................................................

ix. "අපේ ගම" කෘතියේ කතුවරයා කවු ද? ...................................................................................

x. කුවේණි නැමැති යක්ෂ ගෝත්‍රික කුමරියගේ දරු දෙදෙනා කවු ද?

...........................................................................................

(ලකුණු 1*10 = 10 )

09. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

i. "දරුවනි, මේ වනයෙහි විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහිත වු පුෂ්කරණීහුත් වෙති. එසේ හෙයින් තොපි හැම නොකෑ විරූ ඵලාඵලයෙක් කතොත් වේවයි නුපු විරූ පැනක් බොහොත් වේවයි මා විචාරා ම කව බොව" යි විධාන කළෝය.

ii. සඳවා සුදු වැලි පිවිතුරු

බඳවා රන් දද පියකරු

සිටුවා දොර දොර රඹතුරු

තබවා පුන්කුඹු විසිතුරු

(ලකුණු 5*2 = 10 )

10. පහත සඳහන් පැදි කියවා එහි ඇතුළත් අදහස් ගැන සැලකිල්ල යොමු කර, ඒ පිළිබඳ ව ඔබගේ සිතට නැගෙන හැඟීම් වාක්‍ය පහකින් ලියන්න.

i. කිරි බැබළෙන හඳ පාන යි

අහස දිළෙන නිල් වියන යි

සුවඳ හමන සොමි පවන යි

මෙහැම දෙයින මන පිනව යි

ii. සඳරැස් සැමතැන වැටි ලා

සුදටම සැම දේ බබ ලා

ළදරුවෝ ඒ අසිරි බ ලා

මදහස පා නටති ලො ලා

iii. සොබමන් රුව දිලෙන ග හේ

පවසන්නට බැරිය අ ගේ

අහසින් යන්නටම ස ගේ

රිදියෙන් මැවූ පාර ව ගේ

iv. හඳහාමි පිනා පි නා

අප සැමටම සිනාසෙ නා

කිරිත් පැණිත් ගෙනා ගෙ නා

දෙන්න හදයි අපට හි නා

(ලකුණු 2*5 = 10 )

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!